# තනතුරු ඇබෑර්තු

# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

## බෞද්ධ අධ්‍යයන පීඨය

01. ප්‍රමුඛ මහාචාර්ය (බෞද්ධ දර්ශනය) - (තනතුරු 01)

02. ප්‍රමුඛ මහාචාර්ය (පාලි) - (තනතුරු 01)

## ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනාංශය

03. බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ තාවකාලික කථිකාචාර්ය (පුරප්පාඩු තනතුරු 01)

## භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය

## සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය

04. ආධුනික කථිකාචාර්ය / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (අධ්‍යාපන විද්‍යාව) - (තනතුරු 01)

05. ආධුනික කථිකාචාර්ය/ කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (පුරා විද්‍යාව) - (තනතුරු 01)

වැදගත් - පුරාවිද්‍යා, විද්‍යාගාර භාවිතය හා පුරා අස්ථි විද්‍යාව පිළිබඳ දැනුම ඇති අපේක්ෂකයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

## භාෂා අධ්‍යයනාංශය

06. ආධුනික කථිකාචාර්ය / කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (සංස්කෘත) - (තනතුරු 01)

07. ආධුනික කථිකාචාර්ය/ කථිකාචාර්ය (සේවය තහවුරු නොකළ) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය (ඉංග්‍රීසි) - (තනතුරු 01)

**සැ. යු.**

- ❒ ඉහත අධ්‍යයන තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක්කේ බෞද්ධ භික්ෂූන් වහන්සේට පමණි.
- ❒ තනතුරු සඳහා අයදුම් කරන ස්වාමීන් වහන්සේට ඉංග්‍රීසි හා සිංහල යන භාෂා දෙකෙන්ම ඉගැන්වීමේ හැකියාව තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- ❒ ඉහත අංක 04, 05, 06 හා 07 හි සඳහන් තනතුරකට පත් කළහොත් එසේ පත් කළ දින සිට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට අවම වශයෙන් වසර 10ක් සේවය කළ යුතු අතර, මේ සඳහා විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

08. ඉංග්‍රීසි භාෂා උපදේශක (III ශ්‍රේණිය) - (තනතුරු 01)

## පරිපාලන / අධ්‍යයන තනතුරු

09. පුස්තකාලයාධිකාරී

සැ. යු. - පුස්තකාලයාධිකාරී තනතුරට අයදුම් කළ හැක්කේ ගිහි බෞද්ධයන්ට පමණි.

## පරිපාලන / අනධ්‍යයන තනතුරු

10. සහකාර ලේඛකාධිකාරී - (තනතුරු 01)

## ප්‍රතිලාභ

- ❒ ඉහත සඳහන් තනතුරු සඳහා වැටුප්වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අනෙකුත් දීමනා ද හිමි වේ. අධ්‍යයන හා පුස්තකාලයාධිකාරී තනතුරු සඳහා අධ්‍යයන දීමනා හා පර්යේෂණ දීමනා ගෙවනු ලැබේ.
- ❒ විශ්වවිද්‍යාල සේවයට බඳවා ගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15% ක මුදලක් බැර කෙරේ.) සේවක භාරකාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.

## අයදුම්පත්

i. අයදුම්පත් හා අනෙකුත් විස්තර 2020.09.15 දිනට පෙර මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙතට ඉල්ලුම් කරන තනතුර ඇතුළත් ලිපියක් සමඟ සෙ.මී. 23X10 ප්‍රමාණයේ ලිපිනය සහිත, මුද්දර ඇළ වූ ලියුම් කවරයක් එවීමෙන් ලබාගත හැකි අතර, අයදුම්පත් හා බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ඇතුළු විස්තර **www.busl.ac.lk** වෙබ් අඩවියෙන් ද බාගත හැක.

ii. එක් තනතුරකට වඩා අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

iii. මහාචාර්ය තනතුර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 916, 4/2014 හා චක්‍රලේඛ ලිපි අංක 4/2010 ප්‍රකාරවද, පුස්තකාලයාධිකාරී තනතුර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 921 ප්‍රකාරවද අදාල අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය.

## අයදුම් කරන පිළිවෙළ

I. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහතික කරන ලද සහතික පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර** යන ලිපිනයට 2020.09.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ප්‍රමුඛ මහාචාර්ය හා පුස්තකාලයාධිකාරී තනතුරු සඳහා පමණක් අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2020.10.07 දින වේ.

II. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **අයදුම් කරන තනතුර** සඳහන් කළ යුතුය.

III. විශ්වවිද්‍යාල/රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාල ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

IV. නියමිත ආකෘතියෙන් ඉදිරිපත්කර නොමැති, ඉහත අවශ්‍යතාවන්ට පටහැනිව ඉදිරිපත් කරන ලද අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V. අයදුම්කරුවන් කෙටි ලේඛන ගත කිරීම හා එම අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**අනුරාධපුර.**
**2020.08.23**